**ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව**
---------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 19 නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම්හි වැය විෂයයන් 10 කට අදාලව එකතුව රු.22,770,000 ක් වූ ශුද්ධ | ඔබගේ නිරීක්ෂණයන් හා එකඟ වේ. | තාත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදනයෙන් සත්‍ය වියදම රු.21,008,156 ක් වීමෙන් එම වැය විෂයයන් 10 ට අදාලව සියයට 5 සිට සියයට 52 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් නිරීක්ෂණය විය. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂය අංක 1402 හි මූලික ඇස්තමේන්තුව රු.1,600,000 ක් වුවද, සංශෝධිත වියදම් ඇස්තමේන්තුව රු.2,050,000 ක් වීමෙන් රු.450,000 ක විචලතාවයක් නිරීක්ෂණය වූ අතර එය මූලික ඇස්තමේන්තුවෙන් සියයට 28 කි. | කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් විනිමය අනුපාතයේ ඉහළ යාම පාලනය කිරීම සඳහා සැලසුම් නොකල ගැසට්පත් නිකුත් කිරීමට සිදුවිය. මෙවැනි වියදම් පසුගිය වර්ෂවල දැරීමට සිදුවී නොමැති අතර පසුගිය වර්ෂවල වියදම් පිළිබඳව සමාලෝචනය කිරීම් මගින් මෙම වියදම් පුරෝකථනය කිරීමේ හැකියාවක් නොමැත. | මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී පසුගිය වර්ෂයන්හි වියදම් පිළිබඳ සමාලෝචනයක් සිදු කර හැකිතාක් තාත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මූලධන වැය විෂයයන් 04 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනයේ එකතුව රු.1,310,000 ක් වුවද, එම වැය විෂයයන් 04 හි සත්‍ය වියදම්හි එකතුව රු.938,410 ක් වීමෙන් සියයට 9 සිට සියයට 52 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීම් පැවති බව නිරීක්ෂණය විය. | ඔබගේ නිරීක්ෂණයන් හා එකඟ වේ. | තාත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ වැය විෂයය දෙකක ප්‍රතිපාදන මු.රෙ. 66/99 වීරමෙං ක්‍රියාපටිපාටිය හා පරිපූරක ඇස්තමේන්තු මගින් වෙනස් කර තිබුණි. ඒ හේතුවෙන් එම වැය විෂයයන් දෙකෙහි එකතුව රු.2,100,000 ක් වූ මූලික ඇස්තමේන්තුවේ හා එකතුව රු.3,335,000 ක් වූ සංශෝධිත ඇස්තමේන්තුවේ වෙනස ප්‍රතිශතයක් ලෙස සියයට 59 ක් විය. | 296-01-01-2102 ආනයන හා අපනයන බලපත්‍ර වෙනුවෙන් ඉදිරිපත් කරන ලද අයදුම්පත් මාර්ගගත ක්‍රමයට ලබා ගැනීමට පවතින පරිගණක පද්ධතිය දියුණු කිරීම සඳහා මෙම වැය විෂයෙහි වියදම් වැඩිවීම හේතුවෙන් මෙම වැය විෂයෙහි ප්‍රතිපාදන වැඩි කිරීමට සිදුවිය.<br>296-01-01-2401 - කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම සීමා කිරීම හේතුවෙන් මෙම වැය විෂයෙහි වියදම් අඩුවීම නිසා මෙහි ප්‍රතිපාදන ඉතිරි වූ අතර එම ඉතිරිය, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ 296-01-01-2102 වැය විෂයට මාරු කරන ලදි. | මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී පසුගිය වර්ෂයන්හි වියදම් පිළිබඳ සමාලෝචනයක් සිදු කර හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පුරෝකථනය කර තාත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කළ යුත වේ. |

## 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළයුතුව තිබුණත් ඒ අනුව කටයුතුකර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය හා අභ්‍යන්තර පාලනය සඵලදායි කිරීම සඳහා විටින් විට කාර්ය මණ්ඩල රැස්වීම්හිදී ප්‍රගතිය සාකච්ඡා කර ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. එම සාකච්ඡාවලදී හදුනාගත් අභ්‍යන්තර පාලන දුර්වල වියහැකි ස්ථාන ශක්තිමත් කිරීම සඳහා අංක 2018/01, 2018/02, 2018/03, 2018/04, 2019/01,2019/02, 2019/03,2019/04, 2020/01, 2020/02, 2020/03, 2020/04, 2020/05, 2020/06, 2020/07, 2020/08, 2020/09, 2020/10, 2020/11, 2020/12, 2020/13, 2020/14, 2021/01, 2021/02, 2021/03 හා 2021/04 දරණ අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) 1978 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 11 E වගන්තිය | ප්‍රමිතියට පටහැනිව ආනයන සිදු කරන ආනයනකරුවන් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එසේ කර නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය ගැසට් නිවේදනය දැනටමත් කෙටුම්පත් කර ඇති අතර මේ වන විට එම ගැසට් නිවේදනයෙහි ඇතුළත් කරුණු පිළිබඳ දෙපාර්තමේන්තුවේ | 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 11 E වගන්තිය ප්‍රකාරව ආනයනයන් සිදු කරනු ලබන ආනයනකරුවන්ගේ විස්තර ගැසට් |

| | | | | |
|---|---|---|---|---|
| | | | නිලධාරීන් සමඟ වැඩිදුරටත් සාකච්ඡා කෙරෙමින් පවතී. | පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 891 (1) | ඇප තැබිය යුතු නිලධාරීන්ගේ නම් ඇතුළත් ඇප ලේඛනයක් අකාරාදී ක්‍රමයට පිළියෙල කර යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණ සමඟ එකඟවේ. ඉදිරියට දෙපාර්තමේන්තුව විසින් එවැනි ලේඛණයක් සකස් කරගෙන යාමට දැනටමත් කටයුතු සූදානම් කර ඇත. | මුදල් රෙගුලාසි 891 (1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. |
| (ඇ) | 2014 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාලසීමාවකින් පසු හෝ කිලෝ මීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ යන කාරණා අතරින් මූලින්ම යෙදෙන අවස්ථාවට පසුව ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ වාහන 07 න් 06 ක් සඳහා එසේ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණ සමඟ එකඟවේ.<br><br>30/2016 චක්‍රලේඛනයේ 3.1 ඡේදය ප්‍රකාරව මින් ඉදිරියට අනික් වාහන 06 සඳහා ද විගණන විමසුම පරිදි ඉන්ධන පරික්ෂාව නියමිත ආකාරයෙන් ලේඛණයක් සකස් කොට පවත්වා ගෙන යාමට කටයුතු කරගෙන යන බවට වැඩිදුරටත් දන්වමි. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතු වේ. |
| (ඈ) | 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන අයවැය චක්‍රලේඛය | සියලුම අත්‍යාවශ්‍ය නොවන හා ප්‍රමුඛතාවයෙන් අඩු වියදම් කපා හැරීමට කටයුතු කළ යුතු අතර කාර්යාල උපකරණ ◌මිලට ගැනීම ප්‍රමුඛතාවයෙන් අඩු වියදමක් ලෙස සැලකිය යුතුය. එසේ වුවද ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී අංක 2102 දරන ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ වැය විෂයය යටතේ එකතුව රු.3,006,850 ක් වූ වත්කම් මිලට ගැනීමට කටයුතු කර තිබුණි. | 296-01-01-2102 වැය විෂයෙහි සම්පූර්ණ වියදම රු.3,163,351 ක් වශයෙන් සංශෝධනය විය යුතු අතර කොවිඩ් 19 වසංගත අවස්ථාවේදී වුවද දෙපාර්තමේන්තුගත සේවය අඛණ්ඩව පවත්වාගෙන යන ලදි. එම සේවාවන් කොවිඩ් 19 මාර්ගෝපදේශයන්ට යටත්ව වඩා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා මෙම වියදම් දැරීමට සිදුවිය. | යථෝක්ත අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් මිලට ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 2.4 අත්තිකාරම් පියවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ තහනම් කළ නිලධාරියෙකු අදාල රු.335,753 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | වැඩතහනමට ලක් වූ ආර්.ඩී.එම්. ජයවික්‍රම මහතා වෙත රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චෝදනා පත්‍රය මෙම දෙපාර්තමේන්තුව විසින් 2019 අගෝස්තු 26 දින ඔහු වෙත ලියාපදිංචි තැපැල මගින් යවා ඇති අතර නිලධාරියා වෙත යවන ලද චෝදනා පත්‍රය ආපසු මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැත. තවද ඔහු විසින් මේ වන තෙක් ඒ පිළිබඳව කිසිදු දැනුම්දීමක් ද සිදු කර නොමැති බවද කාරුණිකව දන්වා සිටිමි. මේ පිළිබඳව IECD/8/2/15 හා 2019-10-15 දිනැති ලිපිය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇති බවද වැඩිදුරටත් දන්වා සිටිමි. | ලැබිය යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී ඉටු කිරීමට සැළසුම් කළ එහෙත් ඉටු නොකල කාර්යයන් පිළිබඳ නිරීක්ෂණ පහත වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1969 ජනවාරි 16 දිනැති අංක 1969 අංක 01දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. එහෙත් වර්ථමානයේදී එක් එක් විෂයයන්ට අදාල ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් මත පමණක් පදනම්ව කටයුතු කර තිබුණි. එබැවින් මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණ ඉටු වන ආකාරයට කයටුතු කිරීම සඳහා පිළිගත් විද්‍යාලත්මක | 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනත ප්‍රකාරව, ආනයන හා අපනයන පාලක ජනරාල් වෙත හිමි වී ඇති බලය අනුව, මෙම දෙපාර්තමේන්තුවේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු දැනටමත් සිදුකෙරෙමින් පවතී.<br>ඒ අනුව, 2020 වර්ෂයේ දී ඇතිවූ ගෝලීය වසංගත තත්ත්වයය හමුවේ ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන අහිතකර බලපෑම පාලනය කිරීමේ අරමුණින් සමහරක් අයිතම ආනයනය තහනම් කරමින්, | 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු, දැක්ම හා මෙහෙවර අනුව අහිතකර ආනයන හා අපනයනයන් පාලනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| ක්‍රමවේදයක් හෝ ක්‍රියා පටිපාටියක් නොමැති බව විගණනයට නිරීක්ෂණය වන අතර බලපත්‍ර ගාස්තු අය කිරීම පමණක් ප්‍රධාන කාර්යය ලෙස කටයුතු කරන බව නිරීක්ෂණය වුණි. | සමහරක් අයිතම ආනයනය තාවකාලිකව අත්හිටුවමින් හා සමහරක් අයිතම ආනයනය සීමාකරමින් ගැසට් නිවේදන 11 ක් ප්‍රකාශයට පත්කර ඇත. | |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | -------------------------------------- | ---------- |
| ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් මෘදුකාංග සංවර්ධනය සඳහා අනුමත කරන ලද ආයතන සමඟ මෘදුකාංග පද්ධති සම්බන්ධ කිරීම, ජාලගත වීම හා ජාලගත අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම වැනි කටයුතු සිදු කිරීම සඳහා ICTA ආයතය සමඟ 2017 පෙබරවාරි 03 දින අවබෝධතා ගිවිසුම අත්සන් කර තිබූ අතර ඒ අනුව අරමුදල් සැපයීම ICTA ආයතනය විසින් සිදු කර තිබුණි. නමුත් මේ සඳහා විසර්ජන පනතින්ද 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.9,080,000 ක් ලබාගෙන තිබුණු අතර ඉන් රු.8,119,035 ක් වියදම් කර තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතිය අවසන් කිරිමට සමාලෝචිත වර්ෂය තුළ ද කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂයේදී, තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) මගින් මෘදුකාංග පද්ධතිය සංවර්ධනය සඳහා අරමුදල් සපයන බව දන්වා තිබූ නමුත් අනපේක්ෂිත ආකාරයට ICTA ආයතනය විසින් යෝජිත මෘදුකාංග පද්ධතිය එකඟවූ ආකරයෙන් සකස් දීමට අපොහොසත් විය. ඒ පිළිබඳව දිගින් දිගටම ඉල්ලීම් හා සාකච්ඡා සිදුකළ ද එය මේ වනතෙක් සම්පූර්ණ කරදීමට සමත් වී නැත.<br>2018 වර්ෂයේදී පළමු අදියර දියත් කළද එහි තිබූ දෝෂ නැවත සකස් කර දීමට ඔවුන් අපොහොසත්වූ බැවින් එය ක්‍රියාත්මක් කිරීමට නොහැකිවිය.<br>දෙපාර්තමේන්තුවේ දැනට පවතින පරිඝණක පද්ධතියට මාර්ගගතව අයදුම්පත් යොමුකිරීමට හා ගෙවීම් සිදුකිරීමට හැකි වන පරිදි සංවර්ධනය කිරීමට දෙපාර්තමේන්තුව තීරණය කරන ලදී.<br>එමනිසා, 2020 වර්ෂයට වෙන්කරන ලද මුදල් ප්‍රතිපාදන යොදාගෙන එම වැඩ කටයුතු ආරම්භ කර ඇති අතර, මේ වන විට මාර්ගගතව අයදුම්පත්‍ර හා හරපත්‍ර යොමුකිරීමේ පහසුකම නිමකර ඇත. එමෙන්ම මාර්ගගත ගෙවීම් සිදුකිරීමේ පහසුකම පරීක්ෂණ (Testing) මට්ටමේ පවතින අතර එයද ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. | සැලසුම් කළ පරිදි නියමිත දිනට කාර්යය ඉටු කරවා ගැනීමට ක්‍රියාකාරීව මැදිහත් වී ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී ලෙජරය අනුව අවසන් තොග ශේෂය සහ භෞතික භාණ්ඩ ශේෂයන් අතර අයිතම 53 ක අතිරික්තයක්ද අයිතම 30 ක ඌණතාවයක්ද නිරීක්ෂණය වී තිබුණි. එබැවින් දෙපාර්තමේන්තුවේ තොග පාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | බඩු වට්ටෝරු ලේඛනය නිවැරදි කරන ලදී. අතිරික්තයන් ඉන්වෙන්ට්‍රි ගත කිරීමට කටයුතු කර ඇත. භාණ්ඩ සමීක්ෂණ අවස්ථාව වන විට සොයා ගත නොහැකිව තිබී පසුව සොයා ගන්නා ලද මෙම අයිතමය සමීක්ෂණ මණ්ඩලයක් මගින් නැවත සමීක්ෂණයකට යොමු කර ඇත. සමීක්ෂණ මණ්ඩලයේ තීරණය මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | තොග පාලනය කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතු වේ. |

### 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 9.3 ඡේදය ප්‍රකාරව සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු විසින්ම ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබන බවට වග බලාගත යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම පිළිබඳ මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කිරීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර චක්‍රලේඛ මගින් ඇප තැබිය යුතු නිලධාරීන්ට ඇප තබන ලෙස දන්වා ඇත. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආනයනයන් සීමා කළ යුතු හා තහනම් කළ යුතු භාණ්ඩ ආනයනයෙන් වැළැක්වීම | ඔබගේ නිරීක්ෂණ සමඟ එකඟවේ. ආනයන බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ඒ සම්බන්ධයෙන් පසු විපරම් කිරීම සඳහා | බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ගැසට් නිවේදනවලට අනුකූලව |

| | | | |
|---|---|---|---|
| | සඳහා වූ විධිවිධාන ඇතුළත් අංක 2044/40 සහ 2017 නොවැම්බර් 09 දිනැති ගැසට් පත්‍රය මගින් හා පැරණි වාහන රට තුළට ඒම සීමා කිරිම සඳහා වූ 2016 ජුනි 14 දිනැති අංක 1971/10 දරන ගැසට් පත්‍රය මගින් නීති විරෝධී ආනයනයන් රටතුළට ඒම වළක්වා තිබුණි. එහෙත් රේගු දෙපාර්තමේන්තුව අතර අන්තර් සම්බන්ධතාවයක් නොපැවතීම හා දෙපාර්තමේන්තුවේ පාලන පද්ධතියේ පවතින දුර්වලතා හේතුවෙන් ආනයන බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ඒ සම්බන්ධව පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. | සුදුසු ක්‍රමවේදයක් රේගු දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා මෙම දෙපාර්තමේන්තුව මාර්ගගතව එක තලයකට ගෙන එමගින් ඒ ඒ ආයතන අතර අන්තර් සම්බන්ධතාවය පවත්වාගැනීම වෙනුවෙන් තොරතුරු පද්ධතියක් පිළියෙල කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. එමගින් දත්ත හුවමාරු කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයෙන බැවින් ව්‍යාජ ලියකියවිළි ඉදිරිපත් කිරීම වළක්වා ගැනීමට හැකි වනු ඇත. | සිදු කළ යුතු අතර ආනයන බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ඒ සම්බන්ධව පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම කළ යුතු වේ. |
| (ආ) | පාවිච්චි කළ වාහන සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීම<br>(i) 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරන ගැසට් පත්‍රයේ ප්‍රතිපාදනවලට බලපත්‍ර පාලනයට යටත් කරන ලද වාහන සඳහා වන ගැසට් නිවේදනවලට හා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හා රාජ්‍ය අමාත්‍යවරයා විසින් ආනයන හා අපනයන පාලකවරයා වෙත දෙන ලද උපදෙස්වලට පරිබාහිරව 2017 වර්ෂයේ පාවිච්චි කළ මෝටර් කාර් රථ 35 ක් ආනයනය කර තිබුණි. ඉන් රේගු සංයෝජිත වර්ගීකරණ අංක 8703.22.69 යටතේ ආනයනය කළ යුතු අවුරුදු 03 ට වඩා පැරණි Mazda Rx8 පෙට්‍රල් | (i) (ii) ආනයනික වාහනවල මි.ර.ගැ.වටිනාකම මත අයකල යුතු බලපත්‍ර ගාස්තු හා රජයට අයවිය යුතු අතිරේක ගාස්තු අඩුවෙන් අයකර ඇති බවට විගණන විමසුමෙන් පෙන්වාදීමෙන් අනතුරුව ඒ සම්බන්ධව විමර්ෂණයක් කරන ලෙස අධ්‍යක්ෂ, අපරාධ විමර්ෂණ වෙත 2021.05.03 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. | වාහන ආනයනය කිරීමේදී ගැසට් නිවේදනවලට හා ආනයන අපනයන පාලකවරයා වෙත ලබාදෙන උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| මෝටර් රථ (1300CC) 33 ක් රේගු සංයෝජිත වර්ගීකරණ අංක 8703.90.99 යටතේ ආනයනය කිරීම හේතුවෙන් රු.මිලියන 114.6 ක රේගු බදු අහිමි වී තිබුණි. | | පිළිතුරු ලබාදී නොමැත. |
| (ii) 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව, බලපත්‍ර පාලනයට යටත් කල කාලය ඉක්මවා වසර 5 ක් දක්වා වන වාහන සඳහා මි.ර.ගැ. වටිනාකමින් සියයට 15 ක් බලපත්‍ර ගාස්තු ලෙස අයකල යුතු අතර බලපත්‍ර වටිනාකම ඉක්මවා ආනයනය කිරීම මත මි.ර.ගැ. වටිනාකමින් සියයට 3 ක අතිරේක ගාස්තුවක්ද අයකල යුතු ය. ඒ අනුව ආනයනික වාහනවල මි.ර.ගැ. වටිනාකම මත අයකල යුතු බලපත්‍ර ගාස්තු රු.20,404,375 ක් හා අතිරේක ගාස්තු රු.3,509,045 ක් ලෙස මුළු එකතුව රු.23,913,420 ක් අයකර නොතිබුණි. | වාහන ආනයනය කිරීමේදී ගැසට් නිවේදනවලට හා ආනයන අපනයන පාලකවරයා වෙත ලබාදෙන උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. | රේගු සටහන්කරවලට අදාලව හර නිවේදන නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) 2017 අගෝස්තු හා ඔක්තෝබර් මාසවලදී ආනයනකරුවන් දෙදෙනෙකුට අදාලව රේගු සටහන්කර 06 ක් වෙනුවෙන් හර නිවේදන නිකුත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | |

## 4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ---------------------- | ------------------------------------- | ------------- |
| සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්යමණ්ඩලය 111 ක් වූ අතර තථ්‍ය කාර්යමණ්ඩලය 79 ක් වීම හේතුවෙන් පුරප්පාඩු 32 ක් පැවතුණි. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පඩිනඩි කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 49 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.මිලියන 0.62 ක් වී තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් හා එකඟවේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවක සංඛ්‍යාව බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත 2021-01-21 හා 2021-01-30 යන දිනවල පුරප්පාඩු දන්වා යවා ඇති අතර මේ වන විට පුරප්පාඩු පිරවීමට කටයුතු කරගෙන යන බව වැඩිදුරටත් දන්වා සිටිමි. | දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට පවතින අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතු වේ. |